## ද මැසිනොද් විදුහල, කඳාන

### ඉතිහාසය

6 ශ්‍රේණිය

පළමුවන වාරය 2024

නම :- ........................................................ පන්තිය :-.............................. අංකය:-.........................

2024.06.06

Learning Resource Centre
R
De Mazenod College
Kandana

❖ <u>අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න වලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.</u>

1) ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපයෝගී වන සැම දෙයක්ම හඳුන්වන පොදු නාම කුමක්ද?

   i. පුරා වස්තු
   ii. මූලාශ්‍ර
   iii. ජනකතා
   iv. ගණ පොත්

2) ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය හඳුන්වන්නේ,

   i. ක්‍රිස්තු වර්ෂ
   ii. ක්‍රිස්තු පූර්ව
   iii. ශක වර්ෂ
   iv. බුද්ධ වර්ෂ

3) ගුරුගල් ඇටසැකිලි මත ආලේප කර ප්‍රථම වරට අවමංගල්‍ය චාරිත්‍ර ඉටු කල යුගය වන්නේ,

   i. මධ්‍ය ශිලා යුගය
   ii. නවශිලා යුගය
   iii. මහනුවර යුගය
   iv. පුරාශිලා යුගය

4) ඔබේ පාසලේ ඉතිහාසය දැනගැනීමට උදව් කරගත හැකි වඩාත් උචිත ලිඛිත මූලාශ්‍රය කුමක්ද?

   i. ලොග් පොත
   ii. නාමලේඛනය
   iii. පාසල් සඟරා
   iv. නටඹුන්

5) ක්‍රි.ව. 2024 වර්ෂය බුද්ධ වර්ෂ වලින් දැක්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

   i. බු.ව 1480
   ii. බු.ව 2500
   iii. බු.ව 2024
   iv. බු.ව 2568

6) විශාල සතුන්ගේ ඇටකටු වලින් නිවාස ඉදිකළ මානවයා කවුරුන්ද?


   i. හෝමෝ නියැන්ඩතාලන්සිස්
   ii. හෝමෝ සාපියන්
   iii. හෝමෝ ඉරෙක්ටස්
   iv. හෝමෝ හැබිලිස්

7) වී වගාව මුල්වරට ආරම්භ වූයේ කුමන රටින් ද?

   i. චීනය
   ii. මෙක්සිකෝව
   iii. ඉන්දියාව
   iv. නේපාලය

8) මෙම රූපයේ දැක්වෙන්නේ සත්ව ඇට කැබැල්ලකින් සදාගත් බටනලාවකි.මෙය නිර්මාණය කෙරූ මානවයා කව්රුන්ද?

   i. ඔස්ට්‍රලෝපිතිකස්
   ii. හෝමෝ සාපියන්
   iii. හෝමෝ හැබිලිස්
   iv. හෝමෝ ඉරෙක්ටස්



9) පුරා විද්‍යාඥයින් විසින් පුරාන කාලයට අයත් මැටියෙන් තනන ලද ඇකෑත්තක් සොයා ගනු ලැබුවේ,

i. අප්‍රිකාවේ ගල්ගුහවකින් iii. මෙක්සිකෝවෙන්
ii. චීනයෙන් iv. ඊශ්‍රායෙල් ගල්ගුහවකින්

10) මිනිසුන් ආගමික කටයුතු වලට නැඹුරු වීම පළමු වරට පිළිබිඹු වන්නේ,

i. නවශිලා යුගයේ iii. පුරාශිල යුගයේ
ii. මධ්‍යශිලා යුගයේ iv. සිලුරියන් යුගයේ

11) නීග්‍රොයිඩ් යනුවෙන් හැදින්වූයේ ලෝකයේ කුමන ප්‍රදේශ වලට ව්‍යාප්ත වූ හෝමෝ සාපියන්වරුන්ද?

i. අප්‍රිකාවේ iii. චීනය
ii. ආසියාව iv. ජපානය

12) දික්සඳ සෙනෙවියා පිරිවෙන්වාසී මහානාම හිමි විසින් රචනා කරන ලද සාහිත්‍යමය මූලාශ්‍රය වන්නේ,

i. බෝධි වංශය iii. මහා වංශය
ii. දීප වංශය iv. ථූපවංශය

13) පෘථිවිය සෑදී ඇත්තේ,

i. ග්‍රාහක වලිනි iii. වර්ෂාවෙනි
ii. දූවිලි වලාවකිනි iv. ග්‍රහයන්ගෙනි

14) පොළොන්නරුවේ ගල්විහාරය කරවන ලද්දේ,

i. දේවානම්පියතිස්ස රජු iii. වසභ රජු
ii. මහසෙන් රජු iv. I වන පරාක්‍රමබාහු රජු

15) සංස්කෘතික දියුණුව ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද?

i. 3 iii. 5
ii. 4 iv. 6

❖ <u>අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණද, වැරදි නම් ( × ) ලකුණද යොදන්න.</u>


16) ලෝකයේ මුල්ම ජීවීන් බිහිවූයේ ගොඩබිමේදීය. ( )
17) පැරණිතම වානරයා, ඔස්ට්‍රලෝපිතිකස් වේ. ( )
18) ගොඩබිමෙහි හැකයිල්ලන් බිහි වූ යුගය, පැලියොසොයික යුගය වේ. ( )
19) පුරාශිලා යුගයේ මිනිසුන් කණ්ඩායම් ලෙස එළිමහනේ ජීවත් විය. ( )
20) තාවකාලික පැල්පත් සෑදීමට යොමු වූයේ මධ්‍යශිලා යුගයේදීය. ( )

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- ❖ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5කි.

(1)



i. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්ද?
ii. මෙම සලකුණ සොයාගත් රට කුමක්ද?
iii. මෙම සතා ජීවත් වූවා යැයි සැලකෙන්නේ කුමන ස්ථානයක්ද?
iv. මොහු හැඳින්වෙන නාම කුමක්ද?
v. මෙම සතා ජීවත්වී ඇත්තේ මීට වසර කොපමණ කාලයකට පෙර ද?
vi. මෙම සතාගේ දේහ ලක්ෂණ 2ක් ලියන්න.

(ලකුණු 2×6 = 12)

(2)

i. ඉතිහාසය යන්න සරල නිර්වචනයක් ලියන්න. (ලකුණු 3)

ii. ඔබ පාසලේ ඉතිහාසය දැනගැනීමට උපකාරී වන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර 2ක් ලියන්න. (ලකුණු 4)

iii. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ඇති ප්‍රයෝජන 5ක් ලියන්න. (ලකුණු 5)

(3)

i. පහත සඳහන් වර්ෂ බුද්ධ වර්ෂ වලට හරවා ලියන්න. (ලකුණු 4)
 a) ක්‍රි.ව 274
 b) ක්‍රි.පූ 67

ii. පහත සඳහන් මූලාශ්‍ර අයත්වන කාණ්ඩයට අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

- මහාවංශය
- [illegible]
- දීපවංශය
- [illegible]
- [illegible]


- සෙල්ලිපි
- කාසි
- නටබුන්

| සාහිත්‍යමය මූලාශ්‍ර | පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර |
| --- | --- |
| | |
| | |
| | |
| | |

(ලකුණු 8)

(4) පහත දැක්වෙන ප්‍රෙහෙලිකාව සම්පූර්ණ කරන්න.

i.




(ලකුණු 8)

හරහට :- (1) සාරවත් දේ නිපදවූ මානවයා.

(2) ගින්දර නිපදවූ මානවයා.

පහලට :- (1) ගලකින් ගලකට ගසා පතුරක් කඩාගෙන ගල් මෙවලම් සැදූ මානවයා.

(2) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා.

ii. මානව වර්ගයන් අතරින් ඔබ කැමති මානව වර්ගයක් ගෙන එහි සුවිශේෂතා 4ක් ලියන්න.

(ලකුණු 4)

Learning Resource Center
R
De Mazenod College
Kandana

2024.06.06
G.6
History

(5)

i. පෘථිවියේ මහා හිම යුගය අවසන් වීම නිසා ගොවිතැනට හුරු වීමට පටන් ගත්තේ හෙලෝසින යුගයේය.මේ යුගයේ සිදුවූ වෙනස්කම් 3ක් ලියන්න. (ලකුණු 3)

ii. වරිච්චි ගෙවල් වල ලක්ෂණ 2ක් ලියන්න. (ලකුණු 4)

iii. නවශිලා යුගයේ දක්නට තිබූ වෙනස්කම් 5ක් ලියන්න. (ලකුණු 5)


(6)


i. හොලොසීන යුගයේ වගා කල ධාන්‍ය වර්ග 3ක් ලියන්න. (ලකුණු 3)

ii. හොලොසීන යුගයේ මිනිසා උපකරණ තැනීමට භාවිතා කල ද්‍රව්‍ය 2ක් ලියන්න. (ලකුණු 4)

iii. හෝමෝ සාපියන් මිනිස් වර්ග ගණන කීයද?ඒවා මොනවාද? (ලකුණු 5)

(7) පහත සඳහන් ලෝක සිතියම හා මානව වර්ග වල පින්තූර උදව් කරගෙන ඔවුන් ව්‍යාප්ත වූ රටවල් ඊතල මගින් සම්බන්ද කරන්න.






(ලකුණු 3×4 = 12)